# 17. ශුද්ධාත්ම අනුහසට විවෘත වෙමු

ශුද්ධ බව්තීස්ම ස්නාපනය සියලු ම කිතුනු අනුගාමිකයන්ට උතුම් ආගමික පිළිවෙතකි. වර්තමානයේ ශුද්ධ සභාව තුළ සිදු කෙරෙන මෙම පිළිවෙත, බාහිර සංකේතයක් වුව ද වේ මගින් ශුද්ධාත්මයාණන්ගේ වැඩ සිටීම ගෞරවාන්විත ව පිළිගනු ලැබේ. කිතුනු නිකායයන්, බිළිඳු, තරුණ, වැඩිහිටි වයස් සීමාවන්හි බෞතීස්ම ස්නාපනය පිළිගන්වන අතර, එමගින් කිතුනු අනුගාමිකත්වය තහවුරු කෙරේ. කිතුනුවා බෞතීස්ම ස්නාපනය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ සිටීම හේතුකොටගෙන දිරිය හා සවිය ලබමින්, තම ජීවිතයේ නවතාවයක් අත්දකියි. අප දැන් යොමු වන්නේ ජේසුස් වහන්සේ බෞතීස්මය ලත් අවස්ථාවන්ටය. එම සිද්ධිය වටහාගෙන, ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් අප ජීවිතයට නවතාවයක් අත්දැකීමට මග පෙන්වීම් සොයමු.

**ශු. ලූක් 3ඃ 21-22**

ජේසුස් වහන්සේගේ කාලයට පෙර ජුදෙව් ජනතාව අතර ද බෞතීස්ම පිළිවෙත පැවතුණි. එහෙත් එය ජලයෙන් දෝවනය වී පිරිසිදු වීමේ බාහිර සංකේතයකට පමණක් සීමා විය. ස්නාවක ජොහාන් තුමා මෙයට නව අරුතක් දෙමින් ජනතාව කැඳවනු ලැබුයේ පසුතැවිලි වී ජොර්දාන් ගංගාවෙහි බෞතීස්මය ලැබීමට ය. පෙර පාඩමින් ඔබ හැදෑරූ පරිදි ස්නාවක ජොහාන්ගේ කාර්ය වූයේ තමාට පසු ව පැමිණෙන්නට සිටින තැනැන්වහන්සේ පිළිගැනීමට ජනතාවගේ සිත් සතන් පවිත්‍ර කිරීම ය. ඒ සඳහා ඔවුන්ගේ පාපි ක්‍රියාවලින් ඉවත් වීමට ආරාධනා කළේ ය.

ස්නාවක ජොහාන් තුමා ජනතාව දැනුවත් කළේ තමා වතුරෙන් බෞතීස්ම කළ ද තමාට පසු ව පැමිණීමට සිටින ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධාත්මයාණන් හා ගින්නෙන් ජනතාව බෞතීස්ම කරන බව ය. 'ගින්න' දේව අභිමුඛත්වය හා බලයත් පාපයෙන් දවාලා පිරිසිදු වීමත් සඳහා යෙදෙන සංකේතයකි. ශුද්ධාත්මයාණන් වහන්සේ නව ජීවිත පැවැත්මකට ආලෝකය, ධෛර්යය හා ශක්තියෙන් ද කිතුනුවා සන්නද්ධ කරන බව ය. ශුද්ධාත්මය බෞතීස්මයේ දී අපට දායාද වන දේව වරප්‍රසාදයකි. ඉන් ලැබෙන පන්නරය තුළින් දේව රාජ්‍යයේ පුරවැසියන් ලෙස නිර්භීත ව සාක්ෂි දැරීමට අපට මඟ පෙන්වීම ලැබේ.

මනස්ථාපිත ජනතාව ජොර්දාන් ගංගාවෙහි ස්නාවක ජොහාන් අතින් බෞතීස්ම ලබමින් සිටින අවස්ථාවේ ජේසුස් වහන්සේ ද එහි වැඩම කළ සේක. මනස්ථාපනය වීමට උන්වහන්සේට අවශ්‍යතාවයක් නොවුවද, මෙම බෞතීස්මයට සම්බන්ධ වූයේ මන්දැයි ඔබ මීට පෙර ඉගෙනගෙන ඇත.

ජේසුස් වහන්සේ නිහතමානී ව සිය ඥාති සොහොයුරා වූ ස්නාවක ජොහාන්ගෙන් බෞතීස්ම ලැබීම සේවය ආරම්භයේ ම දැක්වූ උතුම් ආදර්ශයකි. මතෙව්, මාක්, ලූක් යන ශුභාරංචි තුනෙහි ම උන්වහන්සේගේ බෞතීස්මය ගැන සඳහන් වේ. (ශු. ලූක් 3: 21) - තව ද මුළු සෙනග බෞතීස්ම ස්නාපනය ලැබූ විට ජේසුස් වහන්සේ ද බෞතීස්ම ස්නාපනය ලබා යාච්ඤා කරමින් සිටිය දී ශුද්ධාත්මයාණන් වහන්සේ පරවියකුගේ රූපාකාරයෙන් උන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක.

**මෙම පාඨය තුළින් අපට පහත සඳහන් කරුණු වටහාගත හැකි ය.**

- ජේසුස් වහන්සේ තම දූත සේවයට නික්ම ආ සේක. ඒ සඳහා උන්වහන්සේ ගලීලයේ නාසරෙත් සිට ජුදයේ ජොර්දාන් ගංතෙරට පැමිණි සේක
- ස්නාවක ජොහාන් තුමාගේ පෙරමග දූත සේවය අනුමත කිරීම
- මනස්ථාපිත මුළු සෙනග සමග එක් වී ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබීම. ඉන් උන්වහන්සේගේ බැහැපත්, නිහතමානී ගුණාංගය ප්‍රකාශ වේ.
- ස්නාවක ජොහාන් තුමාගේ සේවය හා තමන් වහන්සේගේ සේවයේ ඇති සබඳතාවය ප්‍රකාශ කරයි
- ප්‍රාතිහාර්යයන් සිදුවීම
- ස්වර්ගය විවර වීම
- ශුද්ධාත්මයාණන් පරෙවියකුගේ ස්වරූපයෙන් පහළ වීම
- දේව ප්‍රකාශය
- ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබ යාච්ඤාවේ යෙදීම
  මින් ශුද්ධ බෞතීස්මය ලත් කිතුනු අපට සිහිපත් කර දෙන්නේ යාච්ඤාව තුළින් දේව සබඳතාවය වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාවය යි.
- ඒ මොහොතේ දී ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වීම.
- අප ජීවිත තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩ සිටීම
- ජලය බාහිර ජීවිතය පවිත්‍ර කරන අතර ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ අභ්‍යන්තරය පවිත්‍ර කරමින්, මුලු ජීවිත පැවැත්ම ආලෝකවත් කරන සේක. ස්නාවක ජොහාන් තුමා තමා වෙත පැමිණි ජනතාවට ඒ බව දැනුවත් කර තිබුණි. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කරනු ලබන බෞතීස්ම ස්නාපනය ලත් සියල්ලෝම, නව ජීවිත පැවැත්මකින් සන්නද්ධ ව, ආලෝකයට නිර්භීත ව, ධෛර්යවත් ව සාක්ෂි දරති.

**මෙනෙහි කරන්න**
**ඔබ සියල්ලෝ ම ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙන දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. ඔබ අතරෙන් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයට බෞතීස්ම ස්නාපනය කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙන් සැරසී සිටිති.**
**ගලාති 3ඃ 26-27**

**සිතා බලන්න**

ශුද්ධාත්ම බෞතීස්මය ලත් කිතුණු දරුවකු ලෙස, ශුද්ධාත්මයාණන් ඔබ තුළ වැඩ සිටින බව විශ්වාස කරමින්, උන්වහන්සේගේ ආලෝකයන් දැල්වෙන යහපත් ජීවිත පැවැත්මකින්, ඔබ අවට සිටින සැමට දිලෙන තරුවක් වන්න.

ක්‍රියාකාරකම

1. ජේසුස්වහන්සේගේ බෞතීස්ම අවස්ථාවේ දෙවියන් වහන්සේ පවසන ලද වදන්, අන්වෙසක් වූ අවස්ථාවේ ප්‍රකාශ කරන ලද වදන් හා සසඳන්න.

2. 'ශුද්ධාත්මයාණන්' හා ගිත්ත දේව සංකේත ලෙස බයිබලයේ ඉදිරිපත් කර ඇති තවත් අවස්ථා සොයා බලන්න.

3. බෞතීස්මයේ දී ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ කිතුනු ඔබ, ඊට සරිලන අයුරින් ක්‍රියා කරන්නේ කෙසේ ද ?